
# සරසවි ලේඛා
# Sarasavi Lēkhā
# 2014




SIDA/SAREC Research Library
Faculty of Social Sciences
University of Kelaniya - Sri Lanka

දෙවන වෙළුම

ISSN : 2012 - 9629

ප්‍රථම මුද්‍රණය : 2014 දෙසැම්බර්

---

කංචුක නිර්මාණය හා පරිගණක අක්ෂර සංයෝජනය :

---

ජී. එම්. එස්. කේ. ගිරාකඩුව
පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය.

---

මුද්‍රණය :

---

සීඩා/සරෙක් පර්යේෂණ පුස්තකාලය
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

---

ප්‍රකාශනය :

---

සීඩා/සරෙක් පර්යේෂණ පුස්තකාලය
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

# Sarasavi Lēkhā
# 2014

## Consultant Editors

Senior Professor Piyadasa Ranasinghe

Professor A. H. M. H. Abayarathna

## Editors

G. M. S. K. Girakaduwa

D. M. S. K. Herath

## Assistant Editors

J. M. S. Dilinika

G. B. I. Weerasingha

**SIDA/SAREC Research Library**
**Faculty of Social Sciences**
**University of Kelaniya - Kelaniya**
**Sri Lanka.**

# සිංහල විශ්වකෝෂය පිළිබඳ විමසුමක්

ජී. එම්. එස්. කේ. ගිරාකඩුව

## සංක්ෂේපය

පුස්තකාලයක හදවත නම් විමර්ශන සේවයයි. එමෙන් ම විමර්ශන සේවයෙහි ජීව රුධිරය නම් විමර්ශන මූලාශ්‍රයයි. සාධිකාරී මෙන් ම, යාවත්කාලීන හා නවතම විමර්ශන මූලාශ්‍රයන්ගෙන් තොර විමර්ශන සේවාවක් කිසිසේත් පුස්තකාලයක් තුළ පවත්වා ගෙන යාමට නොහැකි ය. පවත්වා ගෙන ගියත් එය ඵල රහිත සේවාවක් වන්නේ නිරායාසයෙනි. මෙසේ සාර්ථක විමර්ශන සේවයක් පවත්වාගෙන යාමේ දී ඒ සඳහා ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර වර්ග 13 ක් පිළිබඳව සඳහන් වන අතර එයින් ද විශ්වකෝෂ සඳහා හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. ලාංකීය පුස්තකාල තුළ නම් විශ්වකෝෂ අතර සිංහල විශ්වකෝෂයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි.

වර්තමානය වන විට බොහෝමයක් පුස්තකාල විමර්ශන කෘතියක් වශයෙන් ප්‍රතිග්‍රහණය කොට ගෙන තිබෙන සිංහල විශ්වකෝෂය යනු කුමක්ද යන්නත් එහි ක්‍රමික විකාසනය පිළිබඳව මෙන්ම වර්තමාන තත්ත්වය පිළිබඳවත් මෙහිදී විමර්ශනයට ලක් කර ඇත. විමර්ශන කෘතියක් වශයෙන් එහි කෙතරම් දුරට විමර්ශනාත්මක ලක්ෂණ අන්තර්ගත වන්නේ ද යන්න විමර්ශන කෘතියක් ඇගයීමේ කරුණු උපයෝගී කර ගෙන සිදු කරනු ලබන විවේචනයකි, මෙය. ඒ අනුව එහි ඇති වැදගත්කම මෙහිදී වරඩ්ඩුවත් විග්‍රහ කොට දක්වා තිබේ.

## හැඳින්වීම

විවිධ වූ සංකල්ප, ජීවන දෘෂ්ටීන් හා විෂම වූ සමාජ රටාවන්ගෙන් සැදුම්ලත් වර්තමාන සමාජය අතිශයින් සංකීර්ණ වූවකි. එවන් සමාජයක දිවි ගෙවන්නා වූ බහුවිධ පුද්ගලයින්ගේ තොරතුරු අවශ්‍යතාවයන් ද විවිධාකාර වෙයි. ඔවුන්ගේ දහසකුත් තොරතුරු අවශ්‍යතාවයන්ට සරිලන සේවාවක් සපයනු වස් පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවා තිබෙනු දැකිය හැකි ය. පුස්තකාලය වෙත පැමිණෙන ඕනෑම මට්ටමක පුද්ගලයෙකුට තෘප්තිමත් විය හැකි පරිදි අවශ්‍යතාවයට අනුව තොරතුරු සැපයීම පුස්තකාලයක වගකීමක් ද වේ. එසේ තොරතුරු සපයනු වස් පුස්තකාලයක විවිධාකාර පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යනු ලබයි. එවන් සේවාවන් අතර විමර්ශන සේවයට අයත් වන්නේ ප්‍රමුඛස්ථානයකි.

එමෙන් ම එකී සේවාව සැපයීම සඳහා පුස්තකාලයක තිබෙන විමර්ශන මෙවලම් වන්නේ බහුවිධ විමර්ශන මූලාශ්‍රයන් ය. ඒ අනුව විමර්ශන සේවාවේ දී ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර වර්ග 13 ක් පිළිබඳව සඳහන් වේ. ඒවා නම්,

1. ග්‍රන්ථනාමාවලී (Bibliographies)
2. ශබ්දකෝෂ (Dictionaries)
3. විශ්වකෝෂ (Encyclopedias)
4. වාර්ෂික ග්‍රන්ථ (Yearbooks)
5. නියමාවලී (Manuals)
6. චරිතාපදානාත්මක මූලාශ්‍ර (Biographical Resources)
7. අනුක්‍රමණිකා (Indexes)
8. මාලික ප්‍රකාශන (Serial Publications)
9. අත්පොත් (Handbooks)
10. නාමාවලී (Directories)
11. භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර (Geographical Resources)
12. රජයේ ප්‍රකාශන (Government Publications)
13. ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර (Audio Visual Resources)

යනාදි යයි. එකී විමර්ශන මූලාශ්‍ර අතරින් විශ්වකෝෂවලට හිමි වන්නේ මූලිකස්ථානයකි. මේ අනුව පුස්තකාලයක විවිධ විමර්ශන මූලාශ්‍ර අතරින් විශ්වකෝෂ සුවිශේෂී විමර්ශන මූලාශ්‍රයක් ලෙස අර්ථ දැක්විය හැකි ය. විශ්වකෝෂ මූලික වශයෙන් කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකි අතර එය,

1. සාමාන්‍ය විශ්වකෝෂ
2. විශේෂ විශ්වකෝෂ

ලෙසින් පෙන්වා දිය හැකි ය. විවිධ දැනුම් පරාසයන්ට අයත් තොරතුරු පොදුවේ සාමාන්‍ය විශ්වකෝෂ තුළින් නිරූපණය කරනු ලබන අතර කිසියම් විශේෂිත විෂය ක්ෂේත්‍රයකට අයත්වන තොරතුරු පමණක් නිරූපිත විශ්වකෝෂ විශේෂ විශ්වකෝෂ ලෙසින් පෙන්වා දිය හැකි ය. හුදෙක් ම විශ්වකෝෂ තුළ අන්තර්ගත තොරතුරු එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව විෂය විශේෂඥයින් විසින් සම්පාදනය කරනු ලබයි. ඒ අනුව සෑම මාතෘකාවක් පිළිබඳව ම සාධිකාරී මෙන් ම නවතම තොරතුරු විශ්වකෝෂ තුළ අන්තර්ගත වේ.

ලාංකේය පුස්තකාල සේවාව දෙසට අවධානය යොමු කර බැලීමේදී ද විමර්ශන සේවය තුළ විශ්වකෝෂ සඳහා ලැබෙනුයේ අද්විතීය ස්ථානයකි. එයින් ද විශ්වකෝෂ අතර සිංහල විශ්වකෝෂය විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් ඉතා දැවැන්ත කාර්ය භාරයක් උපයෝජකයින් වෙත ලබා දීමට සමත් වී තිබෙනු දැකිය හැකි ය. එවන් වැදගත්කමකින් යුත් සිංහල විශ්වකෝෂය ලාංකීය පුස්තකාල විමර්ශන සේවාවේ අග්‍රගන්‍ය කෘතියක් ලෙස ඇගයීමට ලක් කිරීම කාලෝචිත අධ්‍යයනයක් ලෙසින් හැඳින්වීම යුක්ති යුක්ත ය.

මෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ සිංහල විශ්වකෝෂය පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමයි. ඒ අනුව විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් විශ්වකෝෂ පිළිබඳවත් මෙහි දී සුළු වශයෙන් සඳහන් කෙරෙන අතර ම සිංහල විශ්වකෝෂය සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දී තිබේ. සිංහල විශ්වකෝෂය වර්තමානය වන විට බොහෝමයක් පුස්තකාල විමර්ශන කෘතියක් වශයෙන් ප්‍රතිග්‍රහණය කොට ගෙන තිබෙනු දැකිය හැකි ය. ඒ අනුව සිංහල විශ්වකෝෂය යනු කුමක්ද යන්නත් එහි ක්‍රමික විකාසනය පිළිබඳව මෙන්ම වර්තමාන තත්ත්වය පිළිබඳවත් මෙහිදී විමර්ශනයට ලක් කිරීම මෙහි තවත් අරමුණකි. විමර්ශන කෘතියක් වශයෙන් එහි කෙතරම් දුරට විමර්ශනාත්මක ලක්ෂණ අන්තර්ගත වන්නේ ද යන්න විමර්ශන කෘතියක් ඇගයීමේ කරුණු උපයෝගී කර ගෙන විවේචනාත්මකව අධ්‍යයන කිරීම ලෙසින් මෙහි සෙසු අරමුණු ලෙස දැක්විය හැකි ය.

පුස්තකාල උපයෝජකයන්ගේ විමර්ශන තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම පිණිස සිංහල විශ්වකෝෂය කෙතරම් දුරට උපකාර කර ගත හැකිද යන්න පිළිබඳව මෙමඟින් කරුණු අධ්‍යයනය කළ හැකි අතර විමර්ශන මූලාශ්‍රයක් ඇගයීමේ කරුණු උපයෝගී කරගෙන සිදු කර ඇති මෙම අධ්‍යයනය සිංහල විශ්වකෝෂය පිළිබඳ ඇලුම් කරනු ලබන ඕනෑම පාඨකයෙකුට එහි ඇති වැදගත්කම පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකි ය. සිංහල විශ්වකෝෂයෙහි ආරම්භයේ සිට වර්තමාන තත්ත්වය මෙන් ම විමර්ශන කෘතියක අඩංගු විය යුතු විමර්ශනාත්මක ලක්ෂණ මෙතුළින් කෙතරම් දුරට ඉස්මතු වන්නේ ද යන්නත් මැනවින් අවබෝධ කර ගැනීම පිණිස මෙම අධ්‍යයනය අතිශයින් වැදගත් වෙයි. සිංහල විශ්වකෝෂය පිළිබඳව තොරතුරු සොයන්නකුට මෙන් ම ඒ පිළිබඳව යම් අධ්‍යයනයක නිරත කුමන පුද්ගලයෙකුට වුවත් මෙතුළින් ඒ පිළිබඳව වැදගත් තොරතුරු රැසක් නිරාවරණය කර ගැනීමට ද හැකි වනු ඇත.

## සිංහල විශ්වකෝෂයේ ආරම්භය

ශ්‍රී බුද්ධ වර්ෂ 2500 වැනි බුද්ධ ජයන්ති මහෝත්සවය ජාතික ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් නව යුගයක් උදා කෙරිණි. නිදහස් ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් බහුතර සංඛ්‍යාවක මාතෘ භාෂාව වූ සිංහල භාෂාව උසස් අධ්‍යපන සහ කාර්යාලයන්හි මාධ්‍යය වීමේ ලකුණු ද එකල බහුල වී තිබුණි. එබැවින් ජාතික පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම් වස් නානා විද්‍යාත්මක විෂයයන් පිළිබඳව පොත්පත් මෙන් ම කෝෂ ග්‍රන්ථ ද සිංහල භාෂාවෙන් සම්පාදනය කරවීම අත්‍යවශ්‍ය බව පෙනෙන්නට විය. ප්‍රාමාණික සිංහල විශ්වකෝෂයක් නොමැතිකමේ අඩුපාඩුව වටහා ගෙන එය සපුරාලනු වස් ස්ථිර පියවරක් ගැනීමේ සදානුස්මරණීය ගෞරවය 2500 බුද්ධ ජයන්තිය නිමිත්තෙන් ලංකා රජය විසින් පිහිට වනු ලැබූ ලංකා බෞද්ධ මණ්ඩලයට හිමි වෙයි. මෙම මණ්ඩලය විසින්

සිංහල විශ්වකෝෂ කාරක සභාව යන නමින් ගිහි පැවිදි .වියතුන් 81 ක් දෙනෙකුගෙන් සමන්විත විශේෂ සභාවක් පත් කරන ලදි.

මෙම කාරක සභාවේ ප්‍රධාන සභාපති ධූරය හා ප්‍රධාන කර්තෘ ධූරය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතාටත් ලේකම් ධූරය පුංචි බණ්ඩාර සන්නස්ගල මහතාටත් පවරණ ලදි. ස්වදේශ කටයුතු භාර අමාත්‍යව සිටි ටී. ඒ. රත්නායක මැතිතුමා විසින් කොළඹ රොස්මීඩ් පෙදෙසේ අංක 109 දරන ස්ථානයේදී එවක අධ්‍යාපන අධ්‍යක්ෂකව සිටි ටී. ඩී. ජයසූරිය ලංකා බෞද්ධ මණ්ඩලයේ ලේකම්ව සිටි ඒ. ඩබ්ලිව්. පී. ගුරුගේ යන මහතුන් ද ප්‍රමුඛ පිරිසක් ඉදරියෙහි මහා සංඝයා වහන්සේ පිරිත් සජ්ඣායනා කරද්දී 1955 මැයි මස 03 වන දින සිංහල විශ්වකෝෂ කාර්යාලය විවෘත තරනු ලැබී ය. විශ්වකෝෂකරණය සඳහා සම්පූර්ණ පුස්තකාලයක් ඇසුරු කිරීම සඳහා අවශ්‍ය වූ හෙයින් 1956 ජනවාරි මස පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ගොඩනැගිල්ලකට විශ්වකෝෂ කාර්යාලය ගෙන යන ලදි.

සිංහල විශවකෝෂ කාරක සභාවක් පිළියෙල කරන ලදුව ලංකා විශ්වවිද්‍යාලයේ පෙරදිග භාෂා අංශය මගින් ද අනුමත කරන ලද සැලැස්මක් අනුව සිංහල විශ්වකෝෂය පිටු 750 ක් බැගිනුත් කාණ්ඩ දහයකින් පමණ නිම කරවීම අපේක්ෂා කරන ලදි. එම පිටු සංඛ්‍යාවෙන් හරි අඩක් පමණ නවීන විද්‍යාවන් ඇතුළු විශ්ව ඥානය උදෙසාත් ඉතිරි අඩ ලංකාවේ සාහිත්‍යය, ඉතිහාසය හා පුරාවිද්‍යාව, ආගම් හා දර්ශන, නානා කලා ශිල්ප හා සංස්කෘතික අතින් වැදගත් යැයි සැලකෙන විශේෂ කරුණු උදෙසාත් වෙන් කළ යුතු යැයි සම්මත විය.

ආරම්භයේ දී කාරක සභාවේ බලාපෙරොත්තුව වුයේ ඉංග්‍රීසි ආදී භාෂාවන්ගෙන් පළ කොට ඇති විශ්වකෝෂ, ඥානකෝෂ ආදියෙහි ආශ්‍රයෙන් ද නොයෙක් විෂයන්ගේ ප්‍රවීණ වියතුන්ගේ ආධාරයෙන් ද විශ්වකෝෂයට ඇතුළත් විය යුතු ශීර්ෂ පාඨ සියල්ල රැස් කොට ගෙන එම ශීර්ෂ පාඨ යටතේ ලිපි සැපයීමට කැමැති භවතුන්ගේ නාම ලේඛනයක් සපයා ඔවුන් ලවා ඒ ලිපි ලියවා ගෙන අවුරුදු හතරක් ඇතුළත විශ්වකෝෂය කරවීමයි. එහෙත් වැඩිකල් ගතවන්නට මත්තෙන් මේ ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාවෙහි නොයෙදිය හැකි බව ප්‍රත්‍යක්ෂ විය. ඉංග්‍රීසියෙන් පළ කොට ඇති බ්‍රිතාන්‍ය විශ්වකෝෂ, චේම්බර්ස් විශ්වකෝෂය ආදී සුප්‍රකට විශ්වකෝෂ පරීක්ෂා කිරීමෙන් නොනැවතී ඉන්දියාවේ නොයකුත් ප්‍රාන්තයන්හි සම්පාදනය කරගෙන යනු ලබන විශ්වකෝෂ කිහිපයක ම කාර්යය සංවිධානය ද පරීක්ෂා කොට බැලීමෙන් ලාංකේය ජාතික අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සිංහල විශ්වකෝෂ සම්පාදන කාර්යය වඩා සතුටුදායක සැලැස්මක් අනුව සංවිධානය කළ යුතුව තිබුණි.

## සිංහල විශ්වකෝෂයෙහි සංයුතිය

යම්කිසි විෂයයක් යටතේ ලිපි සැපයීම සඳහා තෝරා ගත යුතු ශීර්ෂපාඨ කවරේ ද ඒ ශීර්ෂපාඨ පිළිබඳව ප්‍රමාණවත් ලිපි සැපයීමට සමත් විශේෂඥයෝ කවරහු ද කාර්යාලයෙහි දී කිනම් ශීර්ෂපාඨයන් සපයා ගත හැකි ද ඒ ඒ ලිපිවල ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් කොපමණ විය යුතු ද යනාදී කරුණු නිශ්චය කරගත යුතු විය. විශ්වකෝෂ සැපයීම සඳහා සැලැස්මක් පිළියෙල කර ගත හැකි වනුයේ සෑම විෂයයක් පිළිබඳව ම යටත් පිරිසෙයින් ප්‍රධාන ශීර්ෂ පාඨවත් නිශ්චය කිරීමෙන් අනතුරුව ය. ශීර්ෂපාඨයන්හි පූර්වාපර සම්බන්ධකම් දැක්වීම සඳහා ප්‍රධාන ශීර්ෂයන් යටතේ ඇතුළත් ව උපශීර්ෂ පවා නිශ්චය කරගත මනා ය. මෙසේ මුළු විශ්වකෝෂයේ ම ශිර්ෂපාඨ පිළිබඳ සවිස්තර සැලැස්මක් පිළියෙළ කරන තුරු එහි එකදු පිටක් පවා අවසාන වශයෙන් සකස් කළ නොහැකි ය. ශීර්ෂපාඨ සියල්ල ම අකාරාදී අනුපිළිවෙළින් සූචිගත කොට අනුක්‍රමයෙන් ලිපි සපයා ගත යුතු වේ. විශ්වකෝෂය ප්‍රමාණ ග්‍රන්ථයක් වන හෙයිනුත් සෑම විෂයක් සඳහාම විශේෂඥයන් කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම අපහසු හෙයිනුත් යම් යම් විශේෂඥයින්ගේ සේවය ලබා ගැනීම බැහැරින් ලබා ගැනීම අවශ්‍ය ය.

විද්‍යාත්මක විෂයන්හි ප්‍රවීණ බොහෝ දෙනා සිංහලයෙහි ප්‍රවීණ නොවන හෙයින් එවැන්නක් ඉංග්‍රීසියෙන් සපයා එවන ලද ලිපි සිංහලයට පරිවර්තනය කරවා නැවතත් ඔවුන් වෙත යවා අනුමැතිය ලබා ගෙන පළ කරවිය යුතු වේ. විශ්වකෝෂයෙහි ඇතුළත් වන සෑම විෂයක් පිළිබඳ පාරිභාෂික ශබ්ද බොහෝ ප්‍රමාණයක් තවමත් සපයා නොමැති බැවින් අවශ්‍ය තන්හි පාරිභාෂික ශබ්ද සම්පාදනය ද සංස්කාරකවරුන් විසින් කළ යුතු ය. මෙපරිද්දෙන් විශ්වකෝෂ කරණයේ දී අනුගමනය කළ යුතු වූ මූලධර්ම හා ප්‍රතිපත්ති ද මුහුණ පෑමට සිදු වන විවිධ ප්‍රශ්න ද සලකා

බැලීමෙන් අනුතුරුව සිංහල විශ්වකෝෂය වසරකට එක් කාණ්ඩයක් බැගින් නිකුත් කිරීමට තීරණය විය. අනතුරුව විශ්වකෝෂය සම්පාදනය කරගෙන යන ලද්දේ මෙසේ සංශෝධිත වැඩපිළිවෙළකට අනුව ය.

ආරම්භයේ දී සිංහල විශ්වකෝෂ සම්පාදන කාර්යය රජයේ ස්වදේශ කටයුතු භාර අමාත්‍යංශය යටතේ ලංකා බෞද්ධ මණ්ඩලයේ පරිපාලනය යටතේ විශ්වකෝෂ කාරක සභාව මගින් කරගෙන එන ලදි. 1956 දී රජය මගින් පිහිටුවන ලද සංස්කෘතික දෙපාර්තමේන්තුවට විශ්වකෝෂයේ පාලනය පැවරුණු පසු උක්ත කාරක සභාව විසුරුවා හරින ලදි. විශ්වකෝෂයේ ලිපි සම්පාදනය කරනු ලබන ආකාරය ඒවායෙහි ප්‍රමාණය හා භාෂා තත්ත්වය පිළිබඳ අවබෝධයක් මහජනයා තුළ ඇති කොට ඔවුන්ගේ අදහස් සහ විවේචන දැන ගැනීම සඳහා 1957 දී සිංහල විශ්වකෝෂ ආදර්ශ කලාපයක් නිකුත් කරන ලදි. ඒ පිළිබඳව නොයෙක් විවේචන පළ වූ අතර එකී විවේචනයන් ද මෙම සිංහල විශ්වකෝෂය සාර්ථක කර ගැනීමට මහත් රුකුලක් වී තිබේ.

## සිංහල විශ්වකෝෂයෙහි ව්‍යුහය

ප්‍රමාණ ග්‍රන්ථයක් කොට ගත හැකි වූ අංග සම්පූර්ණ සිංහල විශ්වකෝෂයක් සිංහල පාඨකයා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ දී එබඳු විශ්වකෝෂයකින් අපේක්ෂිත මූලික පරමාර්ථ පිළිබඳව අල්ප මාත්‍ර වූ හෝ දැනුමක් ලබා දිය යුතු වේ. ප්‍රමාණික විශ්වකෝෂයක් වූ කලී විශ්ව ඥානය පිළිබඳ සෑම වැදගත් කරුණක් ම එක් එක් විෂයයක් යටතේ අකාරාදී ක්‍රමයෙන් හෝ එක් විෂයයකට පමණක් සීමා නොකොට සම්මිශ්‍රිත අකාරාදී ක්‍රමයෙන් හෝ සංග්‍රහ කොට සම්පාදනය කෙරෙන කෝෂ ග්‍රන්ථයකි. ශබ්දකෝෂයක් මෙන් අර්ථ පමණක් දීමෙන් නොනවත්නා විශ්වකෝෂය එහි ශීර්ෂ වශයෙන් එන සෑම කරුණක් පිළිබඳව ම සියලු විස්තර විභාග දක්වන්නා වූ ද විවිධ පාඨකයන්ගේ නානා අවශ්‍යතා පිරිමසා ලන්නා වූ ද කෘතියකි. ඇතැම් විෂයයන් පිළිබඳව පොත්පත් පළ වී නොතිබීමේ අඩුපාඩුව පිරිමසාලීම ප්‍රාමාණික විශ්වකෝෂයකින් බලාපොරොත්තු නොවිය යුතු කාර්යය කි. ග්‍රන්ථ ඇසුරින් හෝ පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනී ඇසුරෙන් ආදී නොයෙකුත් නූතන අධ්‍යයන මාර්ගයන්ගෙන් හෝ කිසියම් කරුණක් පිළිබඳව යමෙකු ලබා ගන්නා දැනුමට අමතරව අතිරේක වශයෙන් පැහැදිළි අවබෝධයක් හා විස්තර විභාගාදිය පහසුවෙන් ලබා ගැනීමට මං සැලසීම එයින් අපේක්ෂිත කාර්ය යි. ඇතැම් විෂයන්හි දී පාඨකයාට ප්‍රස්තුත විෂයය පිළිබඳ ප්‍රාථමික දැනුමක් නැතිව වුව ද විශ්වකෝෂ ලිපියක් වටහා ගැනීමේ දුෂ්කරතාවක් ඇති විය නොහැකි ය. එහෙත් විද්‍යාත්මක විෂයය සම්බන්ධයෙන් ප්‍රාමාණික විශ්වකෝෂයක ලිපි සම්පාදනය කරනු ලබන්නේ ප්‍රස්තුත විෂය පිළිබඳ මූලික දැනුමක් ඇති පාඨකයාට ඒ පිළිබඳ උසස් අවබෝධයක් ලබාදීමේ අටියෙනි.

එසේ වුව ද සිංහල විශ්වකෝෂය සම්පාදනයෙහි දී මෙරට සාමාන්‍ය පාඨකයාටත් විවිධ විෂයන් හදාරණ විද්‍යාර්ථීන්ටත් හැකිතාක් ප්‍රයෝජනවත් වන අයුරින් එය පිළියෙළ කිරීමට සෑම ප්‍රයත්නයක් ම දරා ඇත. ලංකාවේ සංස්කෘතිය හා කලාශිල්ප පිළිබඳව කරුණු එක්කොට සංගෘහිත වූ ග්‍රන්ථයන්ගේ විරළකම නිසා ලංකාවේ පාඨකයාට මුහුණ පෑමට සිදු වී තිබෙන දුෂ්කරතාවන් ගැන මෙහි විශේෂ සැලකිල්ලක් යොමු වී ඇති බව දක්නට ඇත. විද්‍යා විෂයක කරුණු පිළිබඳව සිංහලෙන් පළවී ඇති ග්‍රන්ථ සීමා සහිත වුව ද එබදු ග්‍රන්ථ දැන් දැන් සුලභ වී යන හෙයිනුත් ඒ පිළිබඳව සාමාන්‍ය පාඨකයාට තොරතුරු ලබා ගැනීමේ නොයෙකුත් මාර්ග බිහි වී ඇති හෙයිනුත් ඒ පිළිබඳ සාමාන්‍ය දැනීමක් ලබා දීම සිංහල විශ්වකෝෂයෙහි පරමාර්ථය වී නොමැති බව සඳහන් කළ යුතු ය.

විශ්වකෝෂයෙහි ඇතුළත් වන ලිපි හැකිතාක් දුරට සරලව හා සුගම භාෂා විලාශයකින් යුක්තව ඉදිරිපත් කිරීමට මහත් පරිශ්‍රමයක් දරා ඇති අතර විද්‍යාත්මක විෂයන්හි දී සාමාන්‍ය පාඨකයාට තවමත් නුපුරුදු පාරිභාෂික ශබ්ද ව්‍යවහාර කරන්නට සිදුව ඇති නිසාත් සිංහලට තවමත් නුපුරුදු සියුම් විද්‍යාත්මක අදහස් ප්‍රකාශ කරන්නට සිදු වී ඇති නිසාත් එබදු ලිපිවල භාෂාවේ තරමක සංකීර්ණ බවක් කෘත්‍රිම බවක් පෙනී යයි. එහෙත් නූතන විද්‍යාවන් හදාරණ විද්‍යාර්ථීන් එවැනි වචන පිළිබඳ අවබෝධයක් ඇති නිසා එය එතරම් ප්‍රශ්නයක් නොවන බව කිව යුතු ය. විවිධ විෂයයන් පිළිබඳව ලේඛකයන් බොහෝ දෙනෙකුගේ අදහස් ඇතිව සපයනු ලබන ලිපි විශ්වකෝෂයෙහි ඇතුළත් වන හෙයින් භාෂාව අතින් මෙන් ම රචනා ශෛලිය අතින් ද විවිධත්වයක් ඇති වීම නොවැලැක්විය හැක්කකි. කෙසේ නමුදු ස්වභාෂා මාධ්‍යයෙන් විවිධ විද්‍යාවන් පිළිබඳ පුළුල් දැනුමක් ඇති කර ගැනීමට පුල පුලා සිටින විද්‍යාර්ථීන්ට මෙන් ම සාමාන්‍ය පාඨකයාට ද මෙම සිංහල විශ්වකෝෂය මගින් මහදර්ථයක් සැලසෙනවා මෙන් ම එහි නිෂ්ඨාර්ථය වන්නේ ද එයමය.

## සිංහල විශ්වකෝෂයේ වර්ධනය

1963 දී ආරම්භ කරන ලද සිංහල විශ්වකෝෂය අද දක්වා එහි කාණ්ඩ දොළහක් (12) ක් මුද්‍රණද්වාරයෙන් නිකුත් කොට ඇති අතර දහතුන්වැනි කාණ්ඩය නිකුත් කෙරෙමින් පවතියි. ඒවා නිකුත් කොට ඇති වර්ෂයත්, ප්‍රධාන ශීර්ෂයත්, එවකට එහි ප්‍රධාන කර්තෘව සිටියේ කවුරුන් ද යන්නත් පහත සඳහන් වගුව 1 හි දැක්වේ.

| කාණ්ඩය | ප්‍රකාශිත වර්ෂය | ශීර්ෂය | කර්තෘ |
|---|---|---|---|
| 1 | 1963 | අ - අයිසොප්‍රින් | මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි |
| 2 | 1965 | අයිසෝරියාව - ආහාර | මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි |
| 3 | 1967 | ආහාර ආරක්ෂණය - ඉන්ද්‍ර නිම්න ශිෂ්ටාචාරය | මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි |
| 4 | 1970 | ඉන්ද්‍රනීසියාව - උරස් | මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි |
| 5 | 1974 | උරාර්තු - ඖෂධීය ශාක | මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි |
| 6 | 1978 | ක - කාර්මික විද්‍යාව | මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි |
| 7 | කොටස් වශයෙන් 1988 - 1991 | කාර්මික විප්ලවය - කෙවෙල්‍යය | ආචාර්ය හරිස්චන්ද්‍ර විජයතුංග |
| 8 | 1994 | කොංකොඩැට් - ඛමේර් ජනපදය | මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස |
| 9 | 1998 | ග - ගුවන් සේවා | මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස |
| 10 | 2001 | ගුවන් හමුදාව - සෝෂිතාරාමය | මහාචාර්ය මැන්දිස් රෝහණධීර |
| 11 | 2006 | ච - ජ අක්ෂර | මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස |
| 12 | 2012 | ජ - ජාත්‍යන්තරය | මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස |

වගුව 1

මෙතයින් සලකා බලන කල්හි සිංහල විශ්වකෝෂය ආ ගමන් මග අති දීර්ඝ බව පෙනේ. තවමත් සැකසෙමින් පවතින සිංහල විශ්වකෝෂය සිංහල භාෂාවේ ඇති අක්ෂර අනුපිළිවෙළට එනම්, අකාරාදී පිළිවෙළින් අ යන්නේ සිට ඍ යන්න දක්වා ඇති සෑම අක්ෂරයකින් ම ඇරඹෙන සෑම වචනයක් පිළිබඳවම තොරතුරු දැක්වීමට තරම් ගැඹුරු වී තිබේ. එහි අරමුණ සහ අපේක්ෂාව ද එයම ය. සිංහල විශ්වකෝෂය මෙතෙක් ආ ගමන් මගෙහි කාණ්ඩ 12 ක් මුද්‍රණද්වාරයෙන් ද 13 වැනි කාණ්ඩය මුද්‍රණයේ ද පැවතීම සතුටට කරුණකි.

මෙම සිංහල විශ්වකෝෂය භාෂාවේ ඇති සියලුම වචනවලට අර්ථ නිරූපණ දක්වමින් ගඟක් සේ ගලා එන්නා වූ තොරතුරු ප්‍රවාහයකි. එහෙයින් මෙය ඉතාමත් විශිෂ්ට මෙන් ම අනර්ඝතම විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් දැක්විය හැකි ය. සිංහල භාෂාවේ යම් වචනයක් පිළිබඳව එයින් කියැවෙන්නේ කුමක් සම්බන්ධයෙන් ද යන්න සොයා ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා උපකාර කරගත යුතු කදිම විමර්ශන ග්‍රන්ථයක් ලෙසින් පෙන්වා දිය හැක්කේ සිංහල විශ්වකෝෂය යි.

## විමර්ශන කෘතියක් වශයෙන් සිංහල විශ්වකෝෂය ඇගයීම

විමර්ශන මූලාශ්‍රයක් ඇගයීමට ලක් කිරීමේ දී එය ඇගයීමට ලක් කළ හැකි ආකාරයන් කිහිපයක් වෙයි. එකී ඇගයීම් ලක්ෂණයන්ට අනුව සිංහල විශ්වකෝෂය පිළිබඳව විමර්ශනාත්මකව ඇගයීමට ලක් කිරීමේ දී එකී කරුණු දහය (10) ක් ඔස්සේ ඇගයීමට ලක් කළ හැකි ය. හුදෙක් මෙය විමර්ශන

කෘතියක් ඇගයීමේ දී පොදුවේ බලපැවැත්වෙන කරුණු දහයක් ලෙස ද දැක්විය හැකි ය. එම කරුණු දහය (10) නම්,

1. සාධිකාරිත්වය (Authority)
2. අරමුණ (Purpose)
3. ඉලක්ක පාඨක ප්‍රජාව (Audience)
4. වින්‍යාසය (Arrangement)
5. නවතාවය (Currency)
6. ස්වරූපය/ආකෘතිය (Format)
7. විෂය ආවරණය (Coverage)
8. මිල (cost)
9. විශේෂතා (specials Features)
10. භෞතික හා අභ්‍යන්තර නිමාව (External and Internal Format)

යනාදිය යි. සිංහල විශ්වකෝෂයෙහි උක්ත දැක් වූ කරුණු කෙතෙක් දුරට අන්තර්ගත වී ඇද්දැයි මෙතැන් සිට අධ්‍යයනය කෙරේ.

## 1. සාධිකාරිත්වය (Authority)

ග්‍රන්ථයක අඩංගු කරුණුවල වැදගත්කම රඳා පවතින්නේ ඒවායෙහි විශ්වසනීයත්වය හා නිවැරදිතාවය මත ය. මෙනිසා පාඨකයා වෙත නිවැරදි දත්ත සැපයීම ගත් කතුවරුන්ගේ හා ප්‍රකාශකයින්ගේ වගකීම වේ. මෙය හැඳින්වෙන්නේ සාධිකාරිත්වය යන නමිනි. උපයෝජකයන් පුස්තකාලයකට හෝ තොරතුරු මධ්‍යස්ථානයකට පැමිණෙන්නේ තම තමන්ගේ විවිධ වූ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමේ අටියෙනි. එකී තොරතුරු වගකීමෙනුත් නිවැරදි මෙන් ම විශ්වසනීය ලෙසත් සපයා දෙමින් උපයෝජක අවශ්‍යතාව සපුරා දීම පුස්තකාලයාධිපතිවරයා ඇතුළු සමස්ත පුස්තකාල කාර්යය මණ්ඩලයේම භාරධූර වගකීමක් වෙයි. විමර්ශන කෘතියක සාධිකාරිත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ එම කෘතියෙහි අඩංගු තොරතුරුවල හෙවත් විෂය කරුණුවල නිවැරදිතාව, වලංගුතාව හා විශ්වසනීයත්වය ආදිය කෙතරම් දුරට එහි අඩංගුව තිබේද යන්නයි.

ඒ සඳහා එම මූලාශ්‍රයෙහි කතුවරයා කවරෙක් ද ඔහු එම කෘතිය ලිවීමට තරම් සුදුසුකම් ලත් අයෙක් ද ඔහුගේ කීර්ති නාමය අදාළ කෘතිය සම්පාදනය කිරීමේ දී ඒ සඳහා භාවිත කර ඇති අනෙකුත් තොරතුරු මූලාශ්‍ර මොනවා ද අදාළ මූලාශ්‍ර ලිපි එකතුවක් වැනි එකක් නම් එම ලිපි සපයා ඇති කතුවරු අදාළ සුදුසුකම්වලින් සැදුම්ලත් අය ද යනාදිය සලකා බලනු ලැබේ. එපමණක් නොව අදාළ මූලාශ්‍රය ප්‍රකාශයට පත් කරන ස්ථානය හෝ බෙදා හරිනු ලබන ආයතනය බලයලත් නීත්‍යානුකූල කීර්තිමත් ආයතනයක් ද යනාදී කරුණු කෙරෙහි පවා පූර්ණ අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍යම කරුණු ලෙස සාධිකාරිත්වයේදී සලකා බලනු ලැබේ.

සිංහල විශ්වකෝෂය ගත් කල්හි එහි ඉහතින් සඳහන් කළ කරුණු සියල්ලක් ම පාහේ අඩංගු වඩාත් සාධිකාරී ලේඛනයක් ලෙසින් අපට පෙන්වා දීමට හැකි ය. සිංහල විශ්වකෝෂය වනාහී වෙළුම් ගණනාවකින් පරිපූර්ණ වර්ෂ ගණනාවක් තිස්සේ රචනා වෙමින් එන කෘතියකි. එහි නිමාවක් තවමත් අපට දැක ගත නොහැකි ය. මෙසේ එන ගමන් මග අතරතුරේ දී මෙහි කතුවරයා එක් අයෙකු ම නොවීම ගැටලු මතු කරන්නකි. එක් කතුවරයෙකු යටතේ මෙකී සියලු කාණ්ඩ රචනා වීමද සිදු විය නොහැක්කකි. එදා පළමු කාණ්ඩය රචනා කළෝ අද 11-12 වැනි කාණ්ඩ රචනා කිරීමට තරම් කාලයක් ජීවත් නොවූහ. ඒ අනුව සිංහල විශ්වකෝෂය මෙතෙක් ආ ගමන් මගෙහි සුවිශාල කතුවරුන් පරිසකගෙන් සැදුම් ලත් විමර්ශන කෘතියක් ලෙසින් දැක ගත හැකි ය.

මෙහි පළමු කාණ්ඩයේ සිට හය වන කාණ්ඩය දක්වා එනම්, 1963 සිට 1978 දක්වා අතර කාලය තුළ පළ වූ මුද්‍රණ සියල්ලෙහි ම ප්‍රධාන කතුවරයා ලෙස කටයුතු කොට ඇත්තේ ඩී. ඊ. හෙට්ටිආරච්චි ය. මොහු ලංකා විශ්වවිද්‍යාලයෙහි සිංහල පිළිබඳ මහාචාර්යවරයෙකි. හත් වන වෙළුමෙහි ප්‍රධාන කතුවරයා ලෙස කටයුතු කොට ඇත්තේ හරිස්චන්ද්‍ර විජයතුංග ය. මොහු ද අධි නීතිඥවරකු වන අතර ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂයෙහි හා නූතන සිංහල පාරිභාෂිත ශබ්දකෝෂයෙහි ප්‍රධාන කර්තෘ ලෙස කටයුතු කළ උගත් විද්වතෙකි. අට, නවය, එකොළහ සහ

දොළහ යන කාණ්ඩවල කුවරයා ලෙස කටයුතු කොට ඇත්තේ කේ. එන්. ඕ. ධර්මදාස ය. මොහුද උගත් පඬිවරයෙක් වන අතර ග්‍රන්ථ ගණනාවක් සම්පාදනයෙහි නියුතු ගත් කතුවරයෙක් මෙන්ම මහාචාර්යවරයෙකි. 2001 වර්ෂයේදී මුද්‍රණ ද්වාරයෙන් එළි දැක්වුණු දහ වන සිංහල විශ්වකෝෂ කාණ්ඩයෙහි කතුවරයා වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයෙහි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වරයෙකු වන මැන්දිස් රෝහණධීරයන් ය. මෙතුමා ද අතිශය දක්ෂ උගත් කතුවරයෙකි.

මීට අමතරව විශ්වකෝෂයක් යයි කී කල්හි එය එක් කතුවරයෙකුට පමණක් තනිව සිදු කළ නොහැක්කකි. මේ සඳහා විවිධ විෂයන් පිළිබඳව දැනුමක් සහිත පුද්ගලයන්ගේ උපකාරයක් නොමැතිව මෙවැනි කෘතියක් සම්පාදනය කිරිම වඩාත් දුෂ්කර කටයුත්තකි. මෙනිසා මේ සඳහා ලිපි සම්පාදකවරුන් ලෙස දේශීය මෙන් ම විදේශීය විශ්වවිද්‍යාලයන්හි උගත් මනා දැනුමකින් යුතු වූවෝ සහභාගී වී කටයුතු කළහ. මෙය සිංහල විශ්වකෝෂයෙහි සාධිකාරිත්වයට ඍජුවම බලපාන්නකි. මෙසේ උගත් කතුවරුන් සිටිමෙන් හැඟෙන්නේ එකී කෘතියෙහි සාධිකාරිත්වයෙහි ශක්තිමත් බවයි.

සිංහල විශ්වකෝෂයෙහි සාධිකාරිත්වය පිළිබඳව කතා කිරීමේ දී එහි ඇතුළත්ව ඇති කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. එය අත්‍යවශ්‍යම කරුණකි. මෙහි ඇතුළත් කොට ඇති කරුණු සියල්ලක් ම පාහේ බොහෝ උගතුන්ගේ මෙන් ම එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි මනා දැනුමකින් හෙබි විද්වතුන්ගේ ය. මෙනිසා මෙහි ඇතුළත් කරුණු කෙරෙහි කිසිදු සැකයක් ඇති කර ගත යුතු නොවේ. මෙහි කරුණු දැක්වීමේ දී කරුණු සොයා ගන්නා ලද ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ යම් සඳහනක් ද සිදු කොට ඇත. එමෙන් ම එම තොරතුරු පිළිබඳ වැඩිදුර අවධානය සඳහා ආශ්‍රිත කරගත යුතු පොත්පත් පිළිබඳව ද සඳහන් කොට ඇති නිසා මෙහි තොරතුරුවල සාධිකාරිත්වය පිළිබඳ කිසිදු ගැටලුවක් ඇති වන්නේ නැත. නමුත් ඇතැම් තොරතුරු සඳහන් කිරීමේ දී ඒවා සොයා ගන්නා ලද ස්ථානයක් හෝ සඳහන් වන ස්ථානයක් පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ නැත. ජනශ්‍රැතිය ආශ්‍රයෙන් රචනා කරන ලද තොරතුරු ද ඒ අතර වෙයි. ඒවා අප විසින් කෙසේ පිළිගත යුතුද යන්න ගැටලු මතු කරන්නකි. එවැනි තැන් සිංහල විශ්වකෝෂයෙහි සාධිකාරිත්වයට බාධා ඇති කරන මෙන්ම සාධිකාරිත්වය පලුදු කරන ස්ථාන ලෙසින් පෙන්වා දිය හැකි ය.

කෙසේ නමුත් මෙහි තොරතුරුවල සාධිකාරිත්වය පිළිබඳ නිවැරදි තත්ත්වයක් ඇති වන ස්ථාන ලෙසින් මෙහි රූප සටහන් දක්වා ඇති ස්ථාන පෙන්වා දිය හැකි ය. සිතුවම් මෙහි ඇතුළත් තොරතුරුවල සාධිකාරිත්වයට නැතිනම් වලංගුතාවයට ඉමහත් රුකුලකි. සිංහල විශ්වකෝෂයෙහි සඳහන් බොහෝ තොරතුරු සාධිකාරී තොරතුරු ය. සිංහල විශ්වකෝෂයෙහි සාධිකාරිත්වය තහවුරු කෙරෙන අනෙක් වැදගත් කරුණ වන්නේ මෙය මුද්‍රණය කරන සහ ප්‍රකාශයට පත් කරන ස්ථාන හෝ ආයතන පිළිබඳ සඳහන් තොරතුරු ය. සිංහල විශ්වකෝෂය වනාහි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත ය. මේ සඳහා වෙන් වූ වෙනම ම කර්තෘ මණ්ඩලයක් මෙන් ම සිංහල විශ්කෝෂ කාර්යාලය නමින් වෙන් වූ වගකිව යුතු ස්ථානයක් පවා ස්ථාපිත කොට තිබීම තුළින් පැහැදිළි වන්නේ එහි ඇති සාධිකාරිත්වයෙහි ශක්තිමත් බවයි. මෙය රජයේ මුද්‍රණ නීති ගත සංස්ථාවෙහි මුද්‍රාපිත ය. එය ද මෙහි සාධිකාරිත්වයට යම් රුකුලක් සපයයි. මන්ද යත් රජයක් සාමාන්‍යයෙන් සෑම දෙයක් සම්බන්ධයෙන් ම යම් වගකීමක් දරන හෙයිනි. සංස්කෘතික කටයුතු අමාත්‍යංශය මුද්‍රණ සංස්ථාව වැනි ආයතන රජයේ පිළිගත් ආයතන නිසා එහි සාධිකාරරිත්වය පිළිබඳ කිසිදු ගැටලුවක් මතු වන්නේ නොමැත. මේ අනුව සලකා බලන කල්හි මෙහි සාධිකාරිත්වය සියයට සියයක් ම අඩංගු නොවුණත් සමස්තයක් ලෙස අනෙකුත් කෘතීන්ට වඩා වැඩිබව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

## 2. අරමුණ (Purpose)

යම් තොරතුරක් සොයා ගැනීමට විමර්ශනය කිරීමට ඇති මූලාශ්‍ර වර්ග විවිධාකාර ය. ඒ එක් එක් විමර්ශන මූලාශ්‍රයකින් ඉටු වන ඉටුකරනු ලබන කාර්යයන් ද විවිධාකාර ය. තොරතුරක් සොයා ගැනීමට අවශ්‍ය වූ විට භාවිත කළ යුත්තේ කුමන විමර්ශන මූලාශ්‍ර ද යන්න පිළිබඳව මනාව කරුණු දැන ගත යුතු ය. එවිට අවශ්‍ය තොරතුරු පහසුවෙන් හා නිවැරදිව යම් විශ්වසනීයත්වයකින් යුක්තව සොයා ගැනීමට අවස්ථාව උදා වෙයි. විමර්ශන කෘතියක අරමුණු දැන ගැනීමෙන් අපගේ අවශ්‍යතාව සඳහා භාවිත කළ යුතු වන්නේ කුමන විමර්ශන මූලාශ්‍ර දැයි කියා නිගමනය කළ හැකි ය. ඕනෑම විමර්ශන කෘතියක අන්තර්ගත හැඳින්වීම, පෙරවදන, සාරාංශය, වැනි තොරතුරු පරීක්ෂා කර බැලීම

තුළින් එම විමර්ශන මූලාශ්‍රය බිහි කිරීමට හේතු පාදක වූ කරුණු පිළිබඳ මනා වැටහීමක්, අවබෝධයක් ලබා ගත හැකි ය.

සිංහල විශ්වකෝෂයෙහි අරමුණ වී ඇත්තේ සිංහල භාෂාවේ ඇති වචනවලට නිරුක්ති හෙවත් අදාළ වචනයෙන් සඳහන් පුද්ගලයා හෝ එකී වස්තුව නැතහොත් ප්‍රස්තුතය පිළිබඳව කරුණු ගෙනහැර දැක්වීමයි. සිංහල භාෂාවේ ඇති සියලු වචනයන්ට අර්ථකථන සපයා ඇති ග්‍රන්ථය සිංහල විශ්වකෝෂ යයි. සිංහල භාෂාව පිළිබඳ සිංහල බසින් පළ වී ඇති ග්‍රන්ථ ඉතාමත් සීමා සහිත බැවින් විමර්ශනාත්මක තොරතුරු සොයන විද්‍යාර්ථීන්ට මෙන් ම සාමාන්‍ය පාඨකයන්ට ද ඒ පිළිබඳව තොරතුරු සොයා ගැනීම අසීරු නිසාත් එම විෂය කරුණු පිළිබඳ මූලික දැනුමක් ගැඹුරින් ම අධ්‍යයනය කිරීම සිංහල විශ්වකෝෂයෙහි අරමුණු ලෙස දැක්විය හැකි ය. හුදෙක් ම සිංහල භාෂාවේ ඇති ඇතැම් වචන පිළිබඳව විද්වතුන් පවා නිවැරදිව ඉන් ගම්‍ය කරන්නේ කුමක් ද යන්න පිළිබඳව හරිහැටි වැටහීමක් නොමැති තරම් ය. මෙකී කාරණය සීමා කරනු වස් සිංහල භාෂාවේ ඇති එහි භාවිත කරන වචන පිළිබඳවත් ඉන් ගම්‍ය කරන්නේ කුමක් ද යන්න පිළිබඳවත් සිංහල විශ්වකෝෂයෙහි තොරතුරු අන්තර්ගත ය.

නිදසුනක් ලෙස, සිංහල විශ්වකෝෂයෙහි හත් වැනි කාණ්ඩයෙහි පළමු කලාපයෙහි 53 වැනි පිටුවෙහි සඳහන් 'කාවා' යන වචනය පිළිබඳව ගතහොත් කාවා යනු කුඩා සතකු බවත් ඌ පොත්පත්වලට හානි සිදු කරන අතර එය සාමාන්‍යයෙන් ඒ සත්වයා පිළිබඳව කවුරුත් දන්නා සත්‍යයකි. එහෙත් එකී සත්වයා පිළිබඳව විද්‍යාත්මකව විශේෂිත නිරීක්ෂකයෙකු හැරෙන්නට සාමාන්‍ය පාඨකයෙකු දන්නා තොරතුරු ඉතාමත් අල්ප ය. මෙකී කාරණය හේතු කොට ගෙන එම සත්ත්වයා නොදන්නා තොරතුරු රාශියක් ද එකතු කරමින් කාවා පිළිබඳ සඳහනක් සිංහල විශ්වකෝෂය තුළ දක්වා ඇත. සතකු ලෙස කාවා හඳුනා ගෙන ඇති නමුත් ඌ කුමන ආකාරයේ හැඩහුරු කමකින් යුක්ත සත්වයෙකුදැ යි නිවැරදි ලෙසම නොදන්නා නමුත් මේ සඳහා රූප සටහනක් ද සහිතව සිංහල විශ්වකෝෂය තුළ කරුණු ගෙනහැර දක්වා තිබීමෙන් එහි අරමුණ වන්නේ කාවා පිළිබඳව විමර්ශනය කරන්නකුට මනාව තොරතුරු සපයා දීම බව පැහැදිලි ය. මෙහිදී දක්වන්නට යෙදුනේ උදාහරණයක් පමණකි. සමස්ත විශ්වකෝෂය ම ගෙනහැර බැලුවහොත් ඇත්තේ මෙනයින් ම බව වටහා ගත මනා ය.

## 3. ඉලක්ක පාඨක ප්‍රජාව (Audience)

විමර්ශන මූලාශ්‍රයක් වනාහී විවිධ විෂය ක්ෂේත්‍රයන්ට රචනා වූ හෝ නිර්මාණය වූ හෝ ඒවා බව අපි දනිමු. මෙනිසා ඉන් ලබා ගන්නා සේවය ද විවිධාකාර ය. එසේ විවිධ වූ සේවාවක් ලබා ගැනීමට අපේක්ෂිත පාඨක ප්‍රජාව ද විවිධාකාර බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ. මේ අනුව සලකා බලන කල්හි එක් එක් විමර්ශන මූලාශ්‍ර කෘතිවලින් ඉලක්කගත පාඨක ප්‍රජාව එක් අයෙකුම නොවේ. ඇතැම් කෘතියක් එක් විෂය ක්ෂේත්‍රයකට පමණක් සීමා විය හැකි. ඇතැම් කෘතියක් විෂයන් කිහිපයක් ආවරණය කරනවා විය හැකි ය. තවත් සමහර කෘතියක් විෂය පරාසයක් ආවරණය කරනවා ද විය හැකිය. එමෙන් ම තව සමහර කෘතියක් සියලු ක්ෂේත්‍රයන්ට ම අදාළව රචනා වී ඇති බවක් ද දක්නට ඇත. පොතක් ඇගයීමේ දී ඉලක්ක පාඨක ප්‍රජාව යන්නෙන් අදහස් කරනු ලබන්නේ එය රචනා කොට ඇත්තේ කවර මට්ටමේ පාඨකයන්ට ද යන්නයි.

සිංහල විශ්වකෝෂය වනාහී ඕනෑම තරාතිරමක පාඨකයකුට ගැළපෙන ආකාරයට සම්පාදනය කොට ඇති අතර සරල හා සුගම භාෂා විලාශයක් අනුගමනය කොට ඇත. එය තේරුම් ගැනීමට වඩාත් පහසු ය. නමුත් ඇතැම් තොරතුරු සඳහන් කිරීමේ දී යම් යම් විෂය කරුණු පිළිබඳව ආවේණික හෙවත් පාරිභාෂික වචන හා යෙදුම් යොදා ගෙන ඇති නිසා ඒවා තේරුම් ගැනීම ඇතමෙකුට තරමක් අපහසු වන්නට පිළිවන. ඒ හැරෙන්නට සිංහල විශ්වකෝෂයෙහි ඇති විෂය කරුණු තේරුම් ගැනීම කවරෙකුටවත් අපහසු යැයි කිවහොත් එය මිථ්‍යාවක් පමණකි.

''ස්වභාෂා මාධ්‍යයෙන් විවිධ විද්‍යාවන් පිළිබඳව ඉතා පුළුල් දැනුමක් ඇති කර ගැනීමට පුල පුලා බලා සිටින විද්‍යාර්ථීන්ට මෙන් ම සාමාන්‍ය පාඨකයාට ද මෙයින් මහදර්ථයක් සැලසීම අපගේ ප්‍රාර්ථනයයි''

යනුවෙන් ප්‍රථම මුද්‍රණයේ දී කතුවරයා සඳහන් කරන්නේ මෙය සිංහල භාෂාව දන්නා සියලු දෙනා වෙත ප්‍රදානය කරනු ලබන ඉතා සරල විමර්ශන කෘතියක් බවයි. මෙනයින් සලකා බලන කල්හි

සිංහල විශ්වකෝෂය ඇතැම් කරුණු හැරෙන්නට සියල්ලක් ම පාහේ සිංහල බස දන්නා සියලු උපයෝජක ප්‍රජාව ඉලක්ක කර ගෙන රචනා වී ඇති බව කිව මනා ය. මෙම සිංහල විශ්වකෝෂය භාවිත කර ඇති සරල හා සුගම භාෂාවට අමතරව එහි දක්වා ඇති ඇතැම් රූප සටහන් දෙස බැලීම තුළින් පෙන්වා දිය හැකි වන්නේ මෙය ළමුන්ට පවා තේරුම් ගැනීමට හැකි යම් තොරතුරක් ලබා දීමට උත්සාහ දරා ඇති බවකි. විශ්වකෝෂය තුළ කලු සුදු මෙන් ම වර්ණ ඡායාරූප ද බොහෝ ප්‍රමාණයක් ඇතුළත් කොට ඇති බව එය පරිශීලනය කරන්නකුට මොනවට අවබෝධ වන කරුණකි. ළමුන්ට පමණක් නොව වැඩිහිටියකුට වුව ද රූප සටහන් ආශ්‍රයෙන් යම් දෙයක් තේරුම් ගැනීමට පහසුවක් ලබා ගත හැකි ය. මෙනිසා මෙහි ඉලක්ක පාඨක ප්‍රජාව මුලින් සඳහන් කළ පරිදි සිංහල බස හැසිර වීමට හැකි සියලු දෙනා ම බව අවිවාදයෙන් පිළිගත යුතු ය.

## 4. වින්‍යාසය (Arrangement)

විමර්ශන කෘතියක තොරතුරු පෙළ ගස්වා ඇති ආකාරය වින්‍යාසය ලෙසින් හඳුන්වනු ලැබේ. බොහෝ විට විමර්ශන කෘතියක තොරතුරු පෙළ ගැස්වීම සිදු කරනු ලබන්නේ අකාරාදී අනුක්‍රමය හා කාල අනුක්‍රමයයන ක්‍රම දෙකට ය.

මෙහි දී අකාරාදී අනුක්‍රමය යනුවෙන් අදහස් කරනු ලබන්නේ යම් භාෂාවක ආරම්භක අක්ෂරයේ සිට අවසන් අක්ෂරය දක්වා අනුපිළිවෙළට කර ඇති පෙළ ගැස්මයි. උදාහරණ ලෙස සිංහල භාෂාවේ නම් අ යන්නේ සිට ඐ යන්න දක්වා ය. ඉංග්‍රීසි භාෂාවේ නම් A සිට Z දක්වා දැක්වීම අකාරාදී අනුක්‍රම යයි. මේ ආදී ලෙසින් සෑම භාෂාවකම උක්ත පරිදි දැක්වීම අකාරාදී අනුක්‍රමය ලෙසින් හැඳින් වේ.

කාලානුක්‍රමය යනු තොරතුරු සිදු වූ කාලයට අනුව ගොඩ නැගීමයි. එය බොහෝ දුරට භාවිත වන්නේ ඉතාමත් සීමා සහිතව ය. සිංහල විශ්වකෝෂය සකස් වී ඇත්තේ අකාරාදී අනුක්‍රමය උපයෝගී කොට ගෙන ය. මෙය උපයෝජකයන්ට ඉතාමත් පහසු මෙන් ම ලේසි ක්‍රමවේදයකි. මෙමගින් විමර්ශන කෘතියෙහි තොරතුරු ගවේෂණය කරන්නකුට ලෙහෙසියෙන් හා පහසුවෙන් තමන්ට අවශ්‍ය තොරතුරු වෙත ළඟා විය හැකිය. එය උපයෝජකයන්ගේ කාලය දැඩි සේ ආරක්ෂා කරන බුද්ධිමත් අනුක්‍රමයකි. සිංහල විශ්වකෝෂය පමණක් නොව බොහෝ විශ්වකෝෂවල භාවිත වන මෙම අකාරාදී අනුක්‍රමය උපයෝජකයන්ට ඉතාමත් පහසු ය. විශ්වකෝෂයෙහි දැනට මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වී ඇති සියල්ලක්ම නිකුත් වී ඇත්තේ අකාරාදී අනුක්‍රමය යටතේ ය. මෙය විමර්ශන මූලාශ්‍රයක් වශයෙන් එහි තිබෙන වැදගත් ගුණාංගයක් බව අවධාරණය කළ යුතු ය. විමර්ශන කෘතියක තිබිය යුතු වින්‍යාසය යන්න මේ අනුව සිංහල විශ්වකෝෂයෙහි කිසිදු අඩුවකින් තොරවන අන්තර්ගත බව පෙනේ.

## 5. නවතාව (Currency)

විමර්ශන කෘතියක් අනිවාර්යයෙන් ම නවතාවය නැමැති ගුණයෙන් යුක්ත විය යුතු ය. එය තොරතුරු මූලාශ්‍රයකට වඩාත් අත්‍යවශ්‍ය කරුණක් ලෙසින් පුස්තකාලවේදීන් පවා පිළිගත් සත්‍යයකි. ප්‍රකාශනයක් කෙතරම් අලුත් ද යන්න නිර්ණය කිරීම සඳහා යොදා ගත හැකි නිල සාධකය වන්නේ එහි ප්‍රකාශිත දිනයයි. මේ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඒ ඒ විෂය සම්බන්ධයෙන් දිනෙන් දින නිසැකව ම තොරතුරු ඇතුළත් වේ. මාර්ගගත (On-line) ආකාරයෙන් පවතිව මූලාශ්‍රවල නම් මෙම නව තොරතුරු නවතාවකින් යුක්තව ඇතුළත් කිරීමට අවස්ථාව උදා වෙයි. මන්ද යත් එය අවශ්‍ය වෙලාවට අලුත් කිරීමේ (Update) කිරීමේ ගුණයෙන් යුක්ත වන හෙයිනි. අන්තර්ජාලය හරහා භාවිත මූලාශ්‍ර මෙහි දී වඩාත් සුවිශේෂි වන බව කිව යුතු ය.

එනමුත් මුද්‍රිත මූලාශ්‍රයක් ගතහොත් එහි අන්තර්ගත තොරතුරු නවතාවය නැමැති ගුණයෙන් යුක්ත වීම පිළිබඳ සැක සහිත ය. මන්ද යත් මුද්‍රණය කර ඇති දෙයක් නැවත ඊට අලුත් තොරතුරු ඇතුළත් කිරීමට නොහැකි බැවිණි. නමුත් නැවත අලුත් සංස්කරණයක් මගින් ප්‍රති මුද්‍රණ ක්‍රියාවලියක දී නව තොරතුරු මීට ඇතුළත් කළ හැකි ය. ඒ අනුව පොතක නැවත මුද්‍රණය එහි නවතාවය තරමක් දුරට හෝ ආවරණය කරන බව කිව යුතු ය. නමුත් එය වඩාත් ප්‍රායෝගික ක්‍රියාදාමයක් නොවේ. එයට විශාල මුදලක් වැය කිරීමට ද සිදු වෙයි. එය මුද්‍රණ ක්ෂේත්‍රය පැත්තෙන් ගතහොත් තරමක් අපහසු කාර්යයකි. මේ සඳහා අධික වියදමක් දැරීමට සිදු වන නිසා අමතර පොත් වාර්ෂිකව නිකුත් කිරීමට සංස්කාරකවරු ක්‍රියා කරමින් සිටින බව දැකිය හැකි ය. මේවා එකී ග්‍රන්ථයන්ට සපයන ලද

Suppliment ලෙසින් හැඳින්වේ. මෙම වාර්ෂික ග්‍රන්ථ මේවායෙහි නවතාවය ආරක්ෂා කිරීමට තරමක් දුරට හෝ බෙහෙවින් උපකාර වන බව පෙනේ. සිංහල විශ්වකෝෂයෙහි නම් තවමත් එවැන්නක් නොමැති නිසා එහි නවතාවය නැමැති ගුණය පිළිබඳ ප්‍රශ්නයක් මතු කරයි. අද භාෂාවේ පවතින නව වචනයන් එකතු කිරීමට අවස්ථාවක් ඇතත් පැරණි මුද්‍රිත කාණ්ඩ සඳහා එවැන්නක් කිරීමට නොහැකි වීම මෙහි නවතාවයට බාධා එල්ල කරයි.

භාෂාවක් වනාහී දිනෙන් දින අලුත් වන්නක් මිස එක තැන පල් වන්නක් නොවේ. මෙනිසා බස ක්‍රමක්‍රමයෙන් දියුණු වෙනවා මිස තිබෙන වචන නැති වී යන්නේ නැත. මෙනිසා එකතු වන වචන සිංහල විශ්වකෝෂය තුළ ඇතුළත් කිරීමට නොහැකිවීම මෙහි නවතාවයට බාධාවකි. මෙනිසා සිංහල විශ්වකෝෂය තුළ විමර්ශන කෘතියක තිබිය යුතු නවතාවය නැමැති ගුණය අන්තර්ගත නොවන බව කීම උදහසට කරුණක් නොවේ. එනමුත් ප්‍රකාශනයක් බොහෝ දුරට එය ප්‍රකාශයට පත් කළ දිනයෙන් කාලීන බව නිර්ණය කරනවාට වඩා එය අදාළ වකවානුවට කෙතරම් ගැළපේ ද යන්නෙන් එහි නවතාවය පිළිබඳ සටහනක් ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව සිංහල විශ්වකෝෂය අද කාලීන අවශ්‍යතාවක් වන නිසා එහි යම් නවතාවක් ද දැකිය හැකි බව සඳහන් කළ හැකි ය.

## 6. ස්වරූපය/ආකෘතිය (Format)

මෙයින් අදහස් කරනු ලබන්නේ මූලාශ්‍රයක් බිහි වී ඇති ආකාරය යි. එනම්, ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍රයක නම්, CD, DVD, VCD, Online ආදී ලෙසින් පළ වී ඇති අතර මුද්‍රිත මූලාශ්‍රයක නම් ඒවා පිටු එකින් එකට එකතු වන සේ තද බැම්මකින් බැඳ අනුපිළිවෙළට ගොනු කර ඇති ආකාරය යි. එමෙන්ම එහි පිටුවල ස්වභාවය කවරයෙහි ස්වභාවය අකුරු ආදියෙහි මෙන් ම රූපවල ගුණාත්මක භාවය ආකෘතිය මගින් පෙන්වා දෙනු ලැබේ. මෙහිදී සිංහල විශ්වකෝෂය ගත් කල්හි එය ඉතාමත් තද බැම්මකින් බැඳ එකට එකතු කොට ඇත. එය තද මෙන් ම ස්ථිර බැම්මකි. මේ සඳහා කටු වර්ග භාවිත කොට නැති නිසා එය කල්පැවැත්මෙන් ද යුක්තය. එය කෘතියෙහි ඇති එක් විශේෂත්වයක් ලෙස පෙන්වා දිය හැකි ය. බැම්ම සඳහා භාවිත කොට ඇත්තේ නයිලෝන් නූල් සහ ගම් වර්ග පමණකි. මෙනිසා මෙය ඉතාමත් ම ශක්තිමත් බැම්මකි.

මෙහි මුද්‍රිත කඩදාසිය පිළිබඳව සළකා බැලීමේ දී එය මිලෙන් වඩාත් අධික කඩදාසියක් නොවන නමුත් කල් පවත්වා ගත හැකි කඩදාසි වර්ගයක මුද්‍රණය කොට ඇත. අක්ෂර විශ්වකෝෂය තුළ දක්නට ඇත්තේ තරමක් කුඩාවට ය. එය ඇතැම් පාඨකයෙකුට කියවීමේ දී මුහුණ පාන්නට වන එක් ගැටලුවකි. මෙහි තොරතුරු ඉදිරිපත් කර ඇති ස්වරූපය පිළිබඳව කතා කිරීමේ දී තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා යොදා ගෙන ඇති එක් ක්‍රමයක් ලෙස රූප සටහන් භාවිතය හා පින්තූර පෙන්වා දිය හැකි ය. කලු සුදු හා වර්ණ යන දෙවර්ගයෙන් ම පින්තූර මෙහි දැක ගත හැකි ය. සමස්තයක් ලෙස ගත් කල්හි සිංහල විශ්වකෝෂයෙහි ආකෘතිය ප්‍රසංසනීය ය. විමර්ශන කෘතියක් ලෙස එහි තිබෙන ආකෘතිය බහුල ලෙස විමර්ශන කෘතිවල භාවිත කරන ආකෘතියකි. එය පොතෙහි කල් පැවැත්ම සඳහාත් ආරක්ෂාව සඳහාත් වඩාත් හොඳ ආකෘතියක් ලෙසින් අගය කිරීමට හැකි ය.

## 7. විෂය ආවරණය (Coverage)

විමර්ශන මූලාශ්‍රයන් එකින් එකට වෙනස් වන්නා සේ ම ඒවායෙන් ආවරණය කරනු ලබන විෂය පරාසයන් ද එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනී. එක් එක් විමර්ශන ග්‍රන්ථ බිහි වනුයේ එක් එක් විමර්ශන ගැටලුවලට පිළිතුරු ලබා දීම සඳහා ය. වාර්ෂික ග්‍රන්ථයක් ගතහොත් ඒ තුළින් ඉදිරිපත් කරන්නේ එකී අදාළ වර්ෂය තුළ සිදු වූ වැදගත් සිදුවීම් පමණි. එහි අනෙක් කිසිදු විෂයක් පිළිබඳව ඇතුළත් වන්නේ නොමැත. මෙනිසා මේවා විවිධාකාර වෙයි. සිංහල විශ්වකෝෂය දෙස හැරී බැලීමේ දී පෙනී යන්නේ විශ්වකෝෂ ප්‍රධාන වශයෙන් සාමාන්‍ය කරුණු මෙන් ම විවිධ විෂයන්ට අදාළ විෂය කරුණු ද අන්තර්ගත වන බවයි. සිංහල විශ්වකෝෂය ද මෙපරිදිම ය. එහිද අඩංගු වන්නේ සිංහල භාෂාවෙහි ඇති සාමාන්‍ය පරිහරණය කරනු ලබන තොරතුරු පිළිබඳ විග්‍රහ කිරීමකි. ඊට අමතරව යම් යම් විෂයන් තුළ භාවිත කරනු ලබන වචන පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කර ඇත.

මෙනයින් සිංහල විශ්වකෝෂයෙහි විෂය ආවරණය පිළිබඳව සලකා බැලීමේ දී ඉහතින් දැක් වූ පරිදි සාමාන්‍ය සිංහල වචන මෙන් ම විෂයානුබද්ධ වචනවල පවා අර්ථ නිරූපණ පැහැදිලි කිරීම් සිදු කොට ඇති ආකාරය මැනවින් ප්‍රකාශිත ය. මේ අනුව සිංහල විශ්වකෝෂය විෂය ආවරණය අතින් බහුවිධ විෂය ආවරණයක් දැක ගත හැකි ය. සිංහල බසින් විශ්වයේ ඇති සියලු දේ පිළිබඳව

මෙහි දී පැහැදිලිව කරුණු සොයා ගැනීමට හැකි ය. විමර්ශන කෘතියක් ලෙසින් මෙහි තිබෙන එකී ගුණාංගය කිසිදු අඩුවකින් තොරව මෙහි අන්තර්ගත බව නම් කිව යුතු ය. සිංහල භාෂාවෙහි ඇති සියලු ම අංශ කෙරෙහි අවධානය යොමු කරන හෙයින් විෂය ආවරණය අතින් ද ඉතාමත් ඉහළ ස්ථානයක පසුවන බව නම් කාහටත් නැත යයි කිව නොහැකි සත්‍යයකි.

## 8. මිල (Cost)

සාමාන්‍ය කෘතියකට වඩා විමර්ශන මූලාශ්‍රයක් සාමාන්‍යයෙන් මිලෙන් අධික ය. එමෙන් ම සෑම විමර්ශන මූලාශ්‍රයක් ම එකාකාර මිලකින් යුක්ත වන්නේ ද නැත. එසේ වන්නේ ඒවායෙහි අඩංගු තොරතුරුවල තිබෙන්නා වූ වටිනාකම් අනුව ය. ඊට අමතරව ඒවා සම්පාදනය කිරීමට යන පිරිවැයට අනුව විමර්ශන කෘතියක මිල නියම විය හැක. ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍රයකට වඩා කෘතියක් මිලෙන් අධික ය. එසේ වන්නේ පොතක් මුද්‍රණ ද්වාරයෙන් පාඨකයන් වෙත එන්නේ අධික වියදමක් වැය කිරීමෙන් අනතුරුව විමයි. නමුත් අඩු පිරිවැයකින් ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍රයක් පාඨකයා වෙත ලබාදිය හැකි විම නිසා බොහෝ දෙනා විමර්ශනය කිරීම සඳහා කෘතියක් තෝරා ගන්නවාට වඩා ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍රයක් තෝරා ගැනීමට පෙළඹෙති.

සිංහල විශ්වකෝෂයෙහි මිල පිළිබඳව කිසිදු සටහනක් එකුදු කාණ්ඩයකවත් දක්නට නොමැත. එය විමර්ශන මූලාශ්‍රයක් වශයෙන් එහි අඩුපාඩුවකි. මිල පිළිබඳ සටහනක් තිබීම විමර්ශන මූලාශ්‍රයකට අතිශයින් වැදගත් කරුණක් ලෙසින් දැක්විය හැකි ය. තෙරතුරු සොයා යන උපයෝජකයින්ට එහි මිලක් සඳහන් නොවීම නිසා විවිධ ගැටලුවලට මුහුණ පාන්නට සිදු වෙයි. ඇතැම් විට පොතෙහි වටිනාකමට වඩා මිල ගෙවීමට ද සිදු වන්නට පිළිවන. එය උපයෝජක හානියකි. මෙනිසා එකී ප්‍රකාශ ආයතන කෘතියක මිල සඳහන් කිරීමට වග බලා ගත යුතු ය. ඇතැම් විට මෙහි මිල පිළිබඳ කිසිදු සටහනක් නොදමන්නට ඇත්තේ එහි මිල කලින් කල වෙනස් වන්නේ යයි හැඟී ගිය හෙයින් විමට ද පිළිවන. ඒ කෙසේ වුවත් මිල නියම කිරීමක් විමර්ශන කාතියක් වශයෙන් සිංහල විශ්වකෝෂයට නියම වී තිබීම අනිවාර්යය අංගයක් ලෙස අවිවාදයෙන් පිළිගත යුතු ය. විමර්ශන කෘතියක් ලෙසින් මෙය ඇගයීමට ලක් කිරීමේ දී මිලක් සටහන් නොවීම එම කෘතියෙහි අගය අඩු වීමට එක් කරුණක් ද විය හැකිය.

## 9. විශේෂතා (Specials Features)

මේ සම්බන්ධයෙන් කතා කිරීමේ දී විමර්ශන මූලාශ්‍රයක් අනෙකුත් පුස්තකාල ද්‍රව්‍යයන්ට වඩා එහි ඇති සුවිශේෂී ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. එසේ අවධානය යොමු කර බැලීමේ දී සිංහල විශ්වකෝෂය අනෙකුත් විමර්ශන මූලාශ්‍රයන්ට වඩා අතිශයින් ම සුවිශේෂි ස්ථානයක් හිමි කර ගන්නා බව නම් පෙනෙන්නට ඇත. කෘතියක සුවිශේෂිත්වය පිළිබඳව කතා කිරීමේ දී එය පාඨක මිත්‍රශීලීද නැද්ද යන වගත් මෙහි දී සැලකිල්ලට ගනු ලැබේ. පුස්තකකාල හෝ තොරතුරු මධ්‍යස්ථානයන්හි ඇති විමර්ශන මූලාශ්‍ර අතුරින් වඩාත් කැපී පෙනෙන විමර්ශන මූලාශ්‍රයක් වශයෙන් සිංහල විශ්වකෝෂය පෙන්වා දිය හැකි ය. ඒ එසේ වන්නේ එහි අනෙකුත් මූලාශ්‍රයන්ට වඩා වැඩි තොරතුරු ප්‍රමාණයක් විවිධ අංශ ආවරණය කරමින් ඇතුළත් වන හෙයිනි. කෘතියෙහි බාහිර මෙන් ම අභ්‍යන්තර නිමාව ද අඩංගු කරුණු දෙස බැලීම තුළින් ද පෙනී යන්නේ එය අනෙකුත් විමර්ශන මෙන් ම පුස්තකාල ද්‍රව්‍යයන්ට වඩා සුවිශේෂී ස්ථානයක අත්කර ගන්නා බවයි.

හුදෙක් මෙය පාඨක මිත්‍රශීලී ය. සරල මෙන් ම සුගම භාෂාවක් මෙහි අනුගමනය කොට ඇති අතර දෝෂ අඩුවීමත් මෙහි සුවිශේෂිත්වයෙහි එක් පැතිකඩකි. මෙහි අභ්‍යන්තර තොරතුරු ද පාඨකයන්ට පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි වන පරිදි අකාරාදී අනුපිළිවෙළින් රචනා වී ඇත. අවශ්‍ය තොරතුරු වඩාත් ක්ෂණිකව සොයා ගැනීමට මෙය වඩාත් සුදුසු ම ක්‍රමය වේ. මෙහි අනෙකුත් විශේෂතා ලෙස තොරතුරු දක්වීමේ දී චිත්‍ර යොදා ගෙන තිබීම සඳහන් කළ හැකි ය. විමර්ශන මූලාශ්‍රයක් ගත් කල්හි යම් තොරතුරක් දැන ගැනීම සඳහා එය මුල සිට අගට කියවිය යුතු ග්‍රන්ථයක් නොවේ. මෙනිසා සෑම විට ම පාඨකයාට ඉතා ඉක්මනින් ඉන් තොරතුරු සොයා ගැනීමට යම් යම් ක්‍රමවේද එකී කෘතිය අනුගමනය කොට තිබිය යුතු ය. එනයින් බැලූ කල සිංහල විශ්වකෝෂය සුවිශේෂි ස්ථානයක් ගනී. ඒ අනුව එය පාඨකයාගේ කාලය ආරක්ෂා කරන හෙයින් ද යම් සුවිශේෂිත්වයක් මෙම ග්‍රන්ථයට හිමිව තිබේ.

කෙසේ නමුදු සිංහල විශ්වකෝෂය අනෙකුත් විමර්ශන මූලාශ්‍රයන්ට වඩා සිංහල පාඨකයන් අතර වඩාත් සුවිශේෂී මෙන් ම වඩාත් ජනප්‍රිය ය. මුද්‍රිත අකුරුවල ප්‍රමාණය පිළිබඳව හැරෙන්නට අනෙකුත් සිංහලෙන් ලියවී ඇති විමර්ශන කෘතිවලට වඩා සුවිශේෂී ස්ථානයක් මෙම කෘතිය හිමි කර ගෙන ඇති බව සඳහන් කළ යුතු ය. මේ අනුව මෙකී කෘතිය විමර්ශන මූලාශ්‍රයක තිබිය යුතු සුවිශේෂීත්වය නැමැති ගුණය වඩාත් ප්‍රායෝගිකව පෙන්නුම් කරන විමර්ශන කෘතියක් ලෙසින් අගය කළ හැකි ය.

## 10. භෞතික හා අභ්‍යන්තර නිමාව (External and Internal Format)

භෞතික හා අභ්‍යන්තර නිමාව ද විමර්ශන කෘතියක තිබිය යතු අනිවාර්ය ලක්ෂණයක් ලෙසින් පෙන්වා දිය හැකි ය. එය වඩාත් සිත ඇද ගන්නා සුළු නිමාවකින් භෞතිකව මෙන් ම අභ්‍යන්තරව ද තිබිය යුතු ය. උපයෝජකයෙකුගේ සිත කෘතිය කෙරෙහි ඇඳ බැඳ තබා ගන්නා සුලු විය යුතු ය. ඒ සඳහා භෞතික හා අභ්‍යන්තර නිමාවට අතිශයින් වැදගත් ස්ථානයක් හිමි වෙයි. දැනුම් ද්‍රව්‍යයක භෞතික ස්වරූපය එහි බුද්ධිමය අන්තර්ගතය කෙරෙහි මහත් බලපෑමක් නොකරන නමුදු පුස්තකාල ද්‍රව්‍යයක් යනු බහු පුද්ගල භාවිතය සඳහා යොදා ගන්නක් වන හෙයින් හැකි හැම විටම භෞතික වශයෙන් ශක්තිමත් කල් පවත්නා රළු භාවිතයට ඔරොත්තු දෙන අමු ද්‍රව්‍යයන්ගෙන් තැනූ මූලාශ්‍ර අත්පත් කර ගැනීම සෑම විට ම යෝග්‍ය ය. එසේ වුවත් භෞතික ස්වරූපය දෙස බැලීමෙන් ම පමණක් කිසි විටෙකත් මූලාශ්‍රයක් තේරීම සිදු නොකළ යුතු ය. මේ සඳහා කවරයේ ස්වභාවය, බඳින ලද බැම්ම, මුද්‍රිත කඩදාසිය ආදිය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

සිංහල විශ්වකෝෂයෙහි භෞතික මෙන් ම අභ්‍යන්තර නිමාව බොහෝ දුරට ප්‍රසංසනීය ය. සවි ශක්තිමත් ප්‍රිය මනාප පෙනුමකින් යුක්ත ය. පිට කවරය තද බැම්මකින් නයිලෝන් නූල් ඝන කඩදාසි යොදා ගෙන පොතට සවිමත්ව බද්ද කොට ඇත. ඝන පිටකවරටකින් යුත් මෙහි බාහිර නිමාව දීර්ඝ කාලීන පැවැත්මට ඔරෝතතු දෙන පරිදි කෘතියෙහි ආරක්ෂාව ද සැලසෙන පරිදි සකස් කොට තිබේ. ඒ එහි භෞතික නිමාවයි. මෙම නිබැඳුමෙහි පිට කවරයෙහි දක්වා ඇති රූප සටහන් දෙස බැලීමෙන් එහි භෞතික නිමාව කෙබඳු ද යන්න මොනවට වටහා ගත හැකි ය.

මෙහි අභ්‍යන්තර නිමාව පිළිබඳ තොරතුරු දක්වීමේ දී මුද්‍රිත කඩදාසිය පිළිබඳවත් එහි පෙළ ගැස් පිළිබඳවත් කරුණු දැක්වීම වටී. එය ද සිත් ඇද ගන්නා ආකාරයට සකස් කොට ඇත. චිත්‍ර රූ සටහන් ආදිය කලු සුදු මෙන් ම වර්ණ යොදා ගනිමින් මුද්‍රණය කොට ඇති නිසා උපයෝජකයන් එය පරිහරණය කිරීමට පෙළඹෙන්නේ නිතැතින් ම ය. පළල සෙ.මී. 19 කින් ද උස සෙ.මී. 25 කින් ද සමන්විත සිංහල විශ්වකෝෂය තරමක් විශාල කෘතියකි. සෑම වෙළුමක ම පිටු 750- 1000 ත් අතර සංඛ්‍යාවක් අඩංගු වෙයි.මෙහි අභ්‍යන්තර නිමාව පිළිබඳව තවදුරටත් සලකා බැලීමේ දී මුල් පිටු අතරෙහි සංකේත සූචියක් ද අක්ෂර පටිපාටිය දැක්වෙන වගුවක් ද මෙම සෑම කාණ්ඩයකට ම ඇතුළත් කොට ඇත. මෙය පාඨක මඟ පෙන්වීමකි. විමර්ශන කෘතියකට අනිවාර්යයෙන් ම තිබිය යුතු ලක්ෂණයක් ලෙසින් භෞතික හා අභ්‍යන්තර නිමාව මේ අනුව දැක්විය හැකි ය. කොපමණ තොරතුරු ඇතුළත් වුවත් එහි භෞතික පැත්තත් අභ්‍යන්තර පැත්තේත් නිවැරදි විධිමත් නිමාවක් නොමැති නම් එය එතරම් පාඨකයන් පිරිසක් අතරෙහි ජනප්‍රිය වන්නේ නොමැත. කෘතියෙහි වැදගත්කම කියාපාන කැඩපතක් ලෙසින් එහි භෞතික මෙන් ම අභ්‍යන්තර නිමාවද පෙන්වා දීමය හැකි ය. මෙලෙසින් සලකා බලන කල්හි සිංහල විශ්වකෝෂය තුළ භෞතිකව මෙන් ම අභ්‍යන්තරය ද මනා සැකැස්මකට අනුව පෙළ ගස්වා ඇත. එය උපයෝජකයින් තුළ විශ්වසනීයත්වයක් ගොඩ නැගීමට හේතුවක් වෙයි.

## සමාලෝචනය

ඉහත දැක් වූ තොරතුරුවලට අනුව සිංහල විශ්වකෝෂය පිළිබඳවත් එහි අඩංගු තොරතුරු පිළිබඳවත් කරුණු ගෙනහැර බැලීමේ දී අපට වඩාත් පැහැදිලි වන කරුණක් වන්නේ අනෙකුත් මූලාශ්‍රයන්ට වඩා මෙහි ඇති සම විෂමතාවයන් මොනවා ද යන්න කෙරෙහි ය. විමර්ශන මූලාශ්‍රයක් ලෙසින් මෙය ඇගයීමටට ලක් කිරීමේ දී යම් යම් කරුණු කිහිපයක් හැරෙන්නට එහි කිසිදු අඩු ලුහුඬුකමක් දක්නට නොමැත. එයට ප්‍රධාන හේතුවක් ලෙස පරිනත කර්තෘ මණ්ඩලයකගේ අධීක්ෂණය හේතුවක් වූවාට සැක නැත. ඉංග්‍රිසි බසින් ලිය වී ඇති විශ්වකෝෂ දෙස බැලීම තුළින් කෙසේවත් මෙහි ඇති සම විෂමතාවයන් මොනවා ද යන්න පිළිබඳව කිසිදු කරුණක් ඉදිරිපත් කළ නොහැකිය. මන් ද යත් ඒවා අතිශයින් සංකීර්ණ බැවිණි. මෙනිසා ඒවා හා කිසිසේත් මෙය සංසන්දනය කළ නොහැකි ය.

සිංහල බසින් ලියා වී ඇති විශ්වකෝෂ ඉතාමත් අල්ප ය. යම් යම් විෂයන් නියෝජනය කරමින් රචනා වී ඇති විශ්වකෝෂ හැරෙන්නට සමස්තය ආවරණය කරනු ලබන විශ්වකෝෂ දක්නට නොමැත. එසේ ලියා වී ඇති ඒ ඒ විශ්වකෝෂ හා මෙය සංසන්දනය කොට බලන කල්හි මෙය ඉතාමත්ම සංකීර්ණ මෙන් ම විධිමත් කෘතියක් බව කිව යුතු ය. සිංහලෙන් ලියා වී ඇති විමර්ශන මූලාශ්‍ර ගෙන බලන කල්හි ඒවා අතර ප්‍රථමස්ථානයෙහි වැජඹෙන්නේ සිංහල විශ්වකෝෂය යි. කෙසේ නමුදු මෙම කෘතිය විමර්ශනාත්මක තොරතුරු සොයන්නකුට විමර්ශන මූලාශ්‍රයක් ලෙසත් එහි ඇති අගය කියා නිම කළ නොහැකි තරම් ය. මනා සංවිධානයකින් යුක්තව නිම වී ඇති මෙම කෘතිය උගත් බුද්ධිමත් වගකීමක් දැරිය හැකි විද්වතුන් පිරිසකගේ සහාය ඇතිව වඩාත් සංකීර්ණ තොරතුරු සරල හා සුගම බස් වහරක් අනුගමනය කරමින් ඉදිරිපත් කොට ඇති හෙයින් සංසන්දනාත්මකව ගෙන බලන කල්හි අනෙකුත් විමර්ශන මූලාශ්‍රයන්ට වඩා බෙහෙවින් ජනප්‍රිය වැඩි උපයෝජක සංඛ්‍යාවක් තම විමර්ශන තොරතුරු අවශ්‍යතා සඳහා භාවිත කරනු ලබන විමර්ශන කෘතියක් ලෙසින් නිගමනය කළ හැකි ය.

ඉහත සඳහන් කළ පරිදි යාවත්කාලීන නොවීම හා තවත් කුඩා කුඩා කරුණු කිහිපයක් හැරුණු කොට ලොකු කුඩා සැම උපයෝජකයෙකු ම ආදරයෙන් වැළඳ ගන්නා විමර්ශන මූලාශ්‍ර අතර ඉතා අග්‍ර ගන්‍ය කෘතියක් ලෙසින් සිංහල විශ්වකෝෂය නැවතත් සඳහන් කළ හැකි ය. ඒ එහි අන්තර්ගත තොරතුරුවල බහුලතාව නිවැරදි බව විශිෂ්ටත්වය හා විමර්ශන කෘතියක තිබිය යුතු කරුණු සියල්ලක් මෙහි ඇතුළත් වන නිසා ම මිස අන් කිසිදු කරුණක් නිසා නොවේ.

### ආශ්‍රය


- Kent, Allen (1974), Encyclopaedia of Library and Information Science, Vol. 25, Author, New York.
- dictionary.com (2014), Reference Sources [online], Available at: www.dictionary.com, [accessed 05 May 2014]
- wikipedia.org (2014), Reference Sources [online], Available at: http://en.wikipedia.org/wiki/Reference_Reference_ Sou rces, [accessed 05 May 2014]
- ගුණසේකර, ධනපාල (1998), පුස්තකාල විද්‍යාවේ මූලිකාංග, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
- විජයතුංග, හරිස්චන්ද්‍ර (1991), සිංහල විශ්වකෝෂය - සත් වැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.
- හෙට්ටිආරච්චි ඩී. ඊ. (1963), සිංහල විශ්වකෝෂය - පළමු වැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.